**විදුලි සැපයුම් ස්ථායීතා ප්‍රවර්ධන සහය ව්‍යාපෘතිය (ණය-3409-එස්ආර්අයි) - 2021**

විදුලි සැපයුම් ස්ථායීතා ප්‍රවර්ධන සහය ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක 3409-එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. විදුලි බලය සැපයීමේ හා බෙදාහැරීම් පද්ධතිවල කාර්යක්ෂමතාවය හා විශ්වාසනීයබව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 23,068.80කට සමාන එජඩො මිලියන 160.20ක් වන අතර ඉන් රු.මිලියන 16,560කට සමාන එජඩො මිලියන 115ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 6,508.8කට සමාන එජඩො මිලියන 45.2ක් මූල්‍යනය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජුනි 29 දින ආරම්භ කරන ලද අතර 2022 මාර්තු 31 දින වන විට නිම කිරීමට නියමිත අතර පසුව 2023 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම් ප්‍රකාශනය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරිමේදි එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කීරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්ම සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනිම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| **අංකය** | **ගිණුම්කරණ අඩුපාඩු** | **කළමනාකරණයේ අදහස් දැක්වීම්** | **විගණකගේ නිර්දේශ** |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති රු.මිලියන 200ක් වටිනා බී කාණ්ඩයට අයත් වන මෝටර් වාහන වර්ෂ 14ක ප්‍රයෝජනවත් ජීව කාලය සලකමින් ක්ෂය කළ යුතුය. කෙසේවෙතත්, ඉහත සඳහන් කළ වාහන ප්‍රයෝජනවත් ජීව කාලය වර්ෂ 7ක් ලෙස සලකා වැරදි ලෙස ක්ෂය කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 29.67ක අධිවෙන්කිරීමක් සිදු කර තිබුණි. | 2022 දී මෙය නිවැරදි කර ඇත. | අවශ්‍යතාව අනුව නිවැරදි කිරීම සිදු කළ යුතුය. |
| (ආ) | ප්‍රමාද හානි පසුගිය වර්ෂවල. ගෙවිය යුතු ලෙස පෙන්වා ඇති රු. මිලියන 25ක ප්‍රමාද හානිය සමාලෝචිත වර්ෂය තුළ අනෙකුත් ආදායම ලෙස සටහන් කර තිබුණි. | 2022 දී මෙය නිවැරදි කර ඇත. | නිවැරදි ගිණුම්කරණ සටහන භාවිත කළ යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාගෙන් අඩු කළ හැකි මුළු උපරිම මුදල රු. මිලියන 20.9ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 25.2ක් ප්‍රමාද හානි ලෙස අනාවරණය කර තිබුණි. | 2022 දී මෙය නිවැරදි කර ඇත | නිවැරදි මුදල ගිණුමට ගෙන ආ යුතුය. |
| (ඈ) | ඉඩම් තක්සේරු කිරීම සහ මැනීම සඳහා දරන ලද වියදම් අනෙකුත් වියදම් ලෙස සලකා කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා දී ඇති නිසා දේපල, පිරියත සහ උපකරණ රු. මිලියන 26කින් අඩුවෙන් දක්වා ඇත. | ලෙජර් කාඩ්පත මේ සමඟ අමුණා ඇත. | තක්සේරු සහ සමීක්ෂණ වියදම් දේපල, පිරියත සහ උපකරණ යටතේ හඳුනාගත යුතුය. |
| (ඉ) | පළාත් ගබඩාවල පවතින රු. මිලියන 4,244.4ක තොග තිබේද යන්න පිළිබඳ තහවුරු කිරීම් විගණනය වෙත යොමු කර නොතිබුණි. | බෙදාහැරීම් දෙවන අංශය මගින් නඩත්තු කරන ලද ද්‍රව්‍ය මාරු තුණ්ඩු සහ භාණ්ඩ ලැබීමේ තුණ්ඩු ලැයිස්තුවක් විගණන කටයුතු සඳහා විගණනයට ඉදිරිපත් කර ඇත. | අදාළ ගබඩාවලින් තහවුරු කිරීම් ලබා ගැනීමට හැකි වන පරිදි බෙදාහැරීම් දෙවන අංශයේ මෙන්ම බෙදාහැරීමේ ගබඩාවල නිසි ලේඛන පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2021 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලබන විශේෂ විදේශ මුදල් බැංකු ගිණුම් මත ලැබුණු රු. 845,386ක පොලී ආදායම මූල්‍ය ප්‍රකාශනවල වෙනම පෙන්වීම වෙනුවට කෙරිගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. තවද, LKAS 7 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පොලී ආදායම වෙනම ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය. | මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන විශේෂ විදේශ මුදල් බැංකු ගිණුම් වෙත ලැබෙන පොළී මෙන්ම අග්‍රිම ගිණුමට ලැබුණු අරමුදල් සඳහා ගෙවනු ලබන පොලිය (ආ.ස.බැ වෙතින්) කෙරිගෙන යන වැඩ යටතේ වාර්තා කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල කෙරිගෙන යන වැඩවල ශුද්ධ ප්‍රමාණය වෙනම පෙන්වා ඇත. එසේම, විශේෂ විදේශ මුදල් බැංකු ගිණුමට ලැබෙන පොලී ණය උපයෝජන අඩු කරයි. | නිසි හෙළිදරව් කිරීම අවශ්‍ය වේ. |
| (උ) | කෙරිගෙන යන වැඩ ප්‍රකාශයට අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පැකේජ 1,2,3,4,5 සහ 6 සඳහා දරන ලද මුළු වියදම රු. මිලියන 3,295.8ක් වේ. කෙසේවෙතත්, ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාග්ධන දායකත්වය යටතේ කෙරිගෙන යන වැඩ ලෙස අනාවරණය කර ඇති රු. මිලියන 244.3ක් වෙන් වශයෙන් හඳුනාගැනීම සඳහා විගණනය වෙත වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මුළු කෙරිගෙන යන වැඩ සියලුම වියදම් කේත ශේෂවල එකතුවෙන් සමන්විත වේ. | නිසි වාර්තා පවත්වා ගත යුතු අතර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 2.2 නීති,රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම

| අංකය | නීති,රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 සැප්තැම්බර් 18 දිනැති අංක පීඊඩී 01/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ස්පෝට් යුටිලිටි වාහන (Sport Utility Vehicle) දෙකක් සහ රෝද හතරෙන් බලගැන්වෙන කැබ් රථ (four-wheel driven double cabs) දහසයක් පිළිවෙලින් රු. මිලියන 46.8ක සහ රු.මිලියන 153.5ක පිරිවැයකට 2019 සහ 2020 කාලය තුළ මිලදී ගෙන තිබුණි. චක්‍රලේඛයේ අවශ්‍ය පරිදි සභාපති සහ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් වාහන ප්‍රසම්පාදනය සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ව්‍යාපෘති කටයුතු සඳහා ලං.වි.ම ට වෙන්කිරීමට වාහන නොතිබූ බැවින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ස්ථාපිත කමිටුවක අනුමැතිය ලබාගෙන ව්‍යාපෘති විෂය පථය යටතේ වාහන කිහිපයක් සපයා ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලවීම අවශ්‍ය වේ. |
| (ආ) | 2005.01.31 දිනැති පීඊඩී 28 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 8.5ක පිරිවැයකට වාහන කුලියට ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගෙන් අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලයේ චක්‍රලේඛ සහ මාර්ගෝපදේශවලට අනුව අවශ්‍ය සියලුම අනුමැතින් අදාළ ප්‍රසම්පාදන ආයතනවලින් ලබාගෙන ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලවීම අවශ්‍ය වේ. |
| (ඇ) | මුදල් රෙගුලාසි 507 | දෙසැම්බර් 31 දිනට ගබඩා සහ ස්ථාවර වත්කම්වල භෞතික සත්‍යාපනය සිදු කර නොතිබුණි. | ලං.වි.ම රෙගුලාසි සහ මාර්ගෝපදේශ අනුව දෙසැම්බර් 31 දිනට ගබඩා සහ ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපනය සිදුකර විගණන කටයුතු සඳහා සත්‍යාපන ලේඛන අදාළ අංශවලින් විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූල වීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මුල්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2016 ජුනි 10 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 133 | ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ශාඛාව ව්‍යාපෘතිවල සමස්ත විගණනය සිදුකරන අතර එබැවින් ලං.වි.ම තුළ වෙනම අභ්‍යන්තර විගණකවරයෙකු පත් නොමැත. | ව්‍යාපෘතියේ ගනුදෙනු ලං.වි.ම අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කළ යුතුය. |
| (ඉ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.1.2 සහ 2.2.1 ඡේදය | සපයා ඇති තොරතුරු වලට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අනුමත කාර්යමණ්ඩල 74ක් වූ අතර වෙන් කරන ලද කාර්ය මණ්ඩලය 93 ක් විය. කෙසේවෙතත්, පැකේජය 1, 2 සහ 3 ලං.වි.ම අතිරේක සාමාන්‍යාධිකාරී බෙදාහැරීම් දෙවන අංශය (DD2) යටතේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පී සහ ඩී) (DGM) (P&D) බෙදාහැරීම් පළමු අංශය (DD1) විසින් මෙහෙයවන බව විගණනයේදී නිරීක්ෂණය විය. පැකේජ 4,5 සහ 6 ක්‍රියාත්මක කිරීම සඳහා ලං.වි.ම අතිරේක සාමාන්‍යාධිකාරී බෙදාහැරීම් පළමු අංශය (DD1) යටතේ 2016 මැයි 02 දින වෙනම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් පිහිටුවා ඇත. ඊට අමතරව පැකේජය 7 ක්‍රියාත්මක කිරීම සඳහා අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) පත් කර ඇත. තවද, පිළිවෙළින් පැකේජ 1 සිට 6 දක්වා සහ පැකේජය 7 මගින් පෞද්ගලික වියදම් ලෙස රු. මිලියන 385ක් සහ රු. මිලියන 44ක් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා දරා ඇති බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත | චක්‍රලේඛ උපදෙස් අනුව අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඊ) | මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2019 මාර්තු 05 දිනැති 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9 වැනි ඡේදය | ව්‍යාපෘතිය සඳහා මෙහෙයුම් සමාලෝචන කමිටුවක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති ප්‍රගතිය ලං.වි.ම විසින් නිරන්තරව අධීක්ෂණය කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වීම අවශ්‍ය වේ. |

## 2.3 ශේෂයන් තහවුරු කිරීම

| අංකය | ගිණුම් විස්තරය | 2021 දෙසැම්බර් 31 දිනට මුදල | | අනුරූපී වාර්තාවල විස්තරය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| | | මූල්‍ය ප්‍රකාශන අනුව රු. | අනුරූපී වාර්තා අනුව රු. | | | |
| (අ) | කෙරිගන යන වැඩ බෙදාහැරීම් දෙවන අංශය | 4,244,417,042 | පළාත් ගබඩා මගින් ව්‍යාපෘතියේ තොග ලැබීම පිළිබඳව වෙනම ලේඛන පවත්වා ගෙන නොතිබුණු බැවින් තහවුරු කර ගැනීමට නොහැකි විය. | අදාළ ගබඩාවලින් තහවුරු කිරීම් සහ තොග වාර්තා | අදාළ භාණ්ඩ ලැබීමේ තුණ්ඩු (GRN) සහ ද්‍රව්‍ය නිකුත් කිරීමේ තුණ්ඩු (MIN) ලැයිස්තුව බෙදාහැරීම් දෙවන අංශය (DD2) විසින් නඩත්තු කරන අතර විගණනයට ඉදිරිපත් කරන ලදී. | පළාත් ගබඩා මගින් ව්‍යාපෘතියෙන් තොග ලැබීම් පිළිබඳව වෙනම ලේඛන පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | 2021 සඳහා වෙළඳ සහ වෙනත් ගෙවීම් | 6,092,924 | ශේෂය තහවුරු කිරීම් ලබාගෙන නොමැත. | මූල්‍ය ප්‍රකාශන සමඟ තහවුරු කිරීම් නොගැලපේ. | ශේෂය තහවුරු කිරීමේ ඉල්ලීමවල ලිපියේ පිටපත් මේ සමග අමුණා ඇත (ඇමුණුම 53) | ශේෂයන් තහවුරු කිරීමට කටයුතු කළ යුතුය අතර පිළිතුරු විගණනයට එවිය යුතුය. |

# 3. භෞතික කාර්යසාධනය

## 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික සහ මූල්‍ය ප්‍රගතිය

| අංකය | සංරචකය /උප සංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට | | | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය | අත්කර ගත් කාර්ය සාධනය | | | | |
| | | | භෞතික | මූල්‍ය | | | |
| **(අ)** | **පැකේජ 1** | | | | | | |
| | ලොට් 1: කොන්ක්‍රීට් කණු -මී 8.3, කි.ග්‍රෑ1000 (15,000) | 100 | 100 | 89.97 | 2021 වර්ෂයේ 4 වන කාර්තුව සඳහා සැලසුම් කර ඇති ව්‍යාපෘති ක්‍රියාකාරකම් අනුව, ද්‍රව්‍ය | පැකේජය 1හි ලොට් 1 යටතේ සියලුම භාණ්ඩ ලං.වි.ම වෙත භාරදී | කොන්ත්‍රාත්කරුවන් ගෙන් ප්‍රමාද හානි අඩුකර ගැනීමට |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ලොට් 2: කොන්ක්‍රීට් කණු -මී 8.3, කි.ග්‍රෑ 1000 (15,000) | 100 | 100 | 99.99 | සැපයුම 2019 පළමු කාර්තුවෙන් අවසන් වන අතර ගෙවීම් 2020 දෙවන කාර්තුව අවසන් වන විට අවසන් කළ යුතුය. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට වන විට ගෙවීම් පියවා නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. අදාළ කොන්ත්‍රාත්තුවේ සම්පූර්ණ කිරීමේ සහතික ආ.ස.බැ වෙත සහ විගණනය වෙත ලබා දී නොතිබුණි. | තිබුණි. ප්‍රමාද වී භාරදීම හේතුවෙන් ප්‍රමාද හානිවලට එරෙහිව අවසාන ගෙවීමෙන් 10% ක් හිලව් කර ඇත. | කටයුතු කළ යුතුය. |
| | ලොට් 3: කොන්ක්‍රීට් කණු -මී 8.3, කි.ග්‍රෑ1000 (20,000) | 100 | 100 | 99.10 | | | |
| | ලොට් 5: කොන්ක්‍රීට් කණු – ප්‍රී-ස්ට්‍රෙස් (Pre-stressed) මී.11, කි.ග්‍රෑ 350 (2,000) | 100 | 100 | 99.32 | | | |
| **(ආ)** | **පැකේජ 2** | | | | | | |
| | ලොට් 1: එම්වී සහ එල්වී හාඩ්වෙයාර් මිලදී ගැනීම | අවලංගු කර ඇත. | | | | | |
| | ලොට් 2**:** | විෂය පථයෙන් ඉවත් කර ඇත | | | | | |
| | ලොට් 3: පීවීසි මීටර බහාලුම් තනි (100,000ක් ) | 100 | 100 | 90 | 2020 වර්ෂයේ 4 වන කාර්තුව සඳහා සැලසුම් කර ඇති ව්‍යාපෘති ක්‍රියාකාරකම් අනුව, ද්‍රව්‍ය සැපයුම 2018 වර්ෂයේ 3 වන කාර්තුවෙන් අවසන් වන අතර ගෙවීම් 2020 වර්ෂයේ 2 වන කාර්තුව අවසන් වන විට අවසන් කළ යුතුය. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දින විට ගෙවීම් නිරවුල් කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. නැත. අදාළ කොන්ත්‍රාත්තුවේ සම්පූර්ණ කිරීමේ සහතික ආ.ස.බැ වෙත | පැකේජය 3 හි ලොට් අංක 2 යටතේ සියලුම භාණ්ඩ ලං.වි.ම වෙත භාරදී තිබුණි. ප්‍රමාද වී භාරදීම හේතුවෙන් ප්‍රමාද හානිවලට එරෙහිව අවසාන ගෙවීමෙන් 10% ක් හිලව් කර ඇත. | කොන්ත්‍රාත්කරුවන් ගෙන් ප්‍රමාද හානි අඩුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | සහ විගණනය වෙත ලබා දී නොතිබුණි.<br><br>නිමැවුම 3:<br>භාණ්ඩ ස්ථාපනය අවසන් කර නොමැත. | | |
| (ඇ) | **පැකේජ 3**<br>ලොට් 3:<br>කි.මී14 කේබල් | 100 | 100 | 99.99 | සැපයුම්කරු මිල විචලනයන් සඳහා ඉල්ලා ඇත. 2020 වර්ෂයේ 4 කාර්තුව සඳහා සැලසුම් කර ඇති ව්‍යාපෘති ක්‍රියාකාරකම් අනුව ද්‍රව්‍ය සැපයුම 2018 වර්ෂයේ 2 කාර්තුව අවසන් වන අතර ගෙවීම් 2020 වර්ෂයේ 2 කාර්තුවෙන් අවසන් කළ යුතු වේ. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවීම පියවා නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. අදාළ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමේ සහතික ආ.ස.බැ වෙත සහ විගණනය වෙත ලබා දී නොතිබුණි.<br><br>නිමැවුම 3: භාණ්ඩ ස්ථාපනය සම්පූර්ණ කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත | ආරවුල විසඳීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (ඇ) | **පැකේජ 4**<br>කිලෝ වොට් 270, කිලෝ වොට් 33 රැහැන් මාර්ග, කිලෝ වොට් 33 2 එස්එස්බීබී ගැන්ට්‍රි 13ක් ඉදිකිරීම<br>(270kV, 33kV tower lines 13Nos of 33kV 2 SSBB gantries ) | 100 | 41 | 34 | ඩීඩී1, ඩීඩී2, ඩීඩී3 සහ ඩීඩී4 යන රැහැන් මාර්ග දහසයේ ප්‍රගතිය විශ්ලේෂණය කළ විට එම රැහැන් මාර්ග කිසිවක් 100% පාංශු පරීක්‍ෂාව සම්පූර්ණ කර නොතිබුණි. පුත්තලම ජීඑස්එස් (GSS) සිට කීරියන්කල්ලිය දක්වා කිලෝමීටර් 28.2ක් සහ ඉරන්කණ්ඩි ගැන්ට්‍රියේ සිට කුඹුරුපිටියේ ගැන්ට්‍රිය දක්වා කිලෝමීටර් 7.5ක පිළිවෙළින් 35% සහ 40% ක් සම්පූර්ණ කර ඇත. චොයිසි ගැන්ට්‍රි (Choisy Gantry) සිට තවලන්තැන්න දක්වා කිලෝමීටර් 6 ක ප්‍රගතිය 0% විය. රැහැන් මාර්ග දහසය අතරින් රැහැන් මාර්ග දෙකක් පමණක් පැතිකඩ සැලසුම් (profile designing) කර අවසන් කර තිබුණි. අඩුම ප්‍රගතිය වූයේ පුත්තලම ජීඑස්එස් (GSS) සිට කීරියන්කල්ලිය දක්වා කි.මී. 28.2 න් 10%ක් පමණක් නිම කර ඇත. 100% ටවර් ස්පෝට් (Tower spotting) කිරීමේ ප්‍රගය රැහැන් මාර්ග දෙකක පමණක් නිරීක්ෂණය විය. කෙසේවෙතත්, පුත්තලම ජීඑස්එස් සිට | 1. පාංශු පරීක්ෂාව-ඩීඩී1-71%, ඩීඩී2-80.0%, ඩීඩී3-86%, ඩීඩී4-73%<br>2. පුත්තලම ජීඑස්එස් සිට කීරියන්කල්ලිය දක්වා පාංශු පරීක්ෂාව 35%, ඉරන්කණ්ඩි ගැන්ට්‍රියේ සිට කුඹුරුපිටිය දක්වා පාංශු පරීක්ෂාව 100%<br>3.චොයිසි – තවලන්තැන්න මාර්ගයේ මේ වන විට එම මාර්ගය සඳහා පාරිසරික අනුමැතිය ලැබී ඇති අතර මාර්ගය සැලසුම් කිරීමේ කටයුතු අවසන් කර ඇත. ඉන් පසුව පාංශු පරීක්‍ෂණ කටයුතු ආරම්භ කරනු ලැබේ.<br>4. පැතිකඩ නිර්මාණය මාර්ග 16 70%කට වඩා සම්පූර්ණ කර ඇත.<br>5. ටවර් ස්පොටින් (Tower Spotting) 90% වන අතර දුෂ්කර භූමි ප්‍රදේශ සහ ඉඩම් හිමියාගේ විරෝධතා හේතුවෙන් ඉතිරිය පවතී. | කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ කඩිනම් කළ යුතු අතර කටයුතු සමීපව අධීක්ෂණය කළ යුතුය. |

කිරියන්කල්ලියට කිලෝමීටර් 28.2ක ප්‍රගතිය 0% වූ අතර විමලසුරේන්ද්‍ර ජීඑස්එස් සිට මස්කෙළිය ගැන්ට්‍රිය දක්වා කි.මී 10ක්, ඉරන්කණ්ඩි ගැන්ට්‍රිය සිට කුඹුරුපිටිය ගැන්ට්‍රිය කිලෝමීටර් 7.5ක් සහ කප්පල්තුරේ ගැන්ට්‍රිය සිට 6 වැනි සැතපුම් කණුව ගැන්ට්‍රිය දක්වා කිලෝමීටර් 13.6 ප්‍රගතිය 20%-40% දක්නට ලැබුණි. චොයිසි ගැන්ට්රිය (Choisy Gantry) සිට තවලන්තැන්න කි.මී 6, මාතර ජීඑස්එස් සිට යකාබැද්ද ජීටී(GT) දක්වා කි.මී 21 කිසිදු ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි.

රුහැන් මාර්ග දහසයකින් රුහැන් මාර්ග හතක් පමණක් අත්තිවාරම් කටයුතු ආරම්භ කර තිබුණි. රුහැන් මාර්ග තුනක් 29% සිට 36% දක්වා ප්‍රගතියක් පෙන්නුම් කරන අතර අනෙක් හතර 5.4%ට වඩා අඩු ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. 2021 දෙසැම්බර් 31 වන විටත් ගැන්ට්‍රි සඳහා ඉඩම් දහතුනක ඉඩම් අත්පත් කර ගැනීම අවසන් කර ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

6. රුහැන් මාර්ග 16කින් රුහැන් මාර්ග 11ක අත්තිවාරම් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.

මහියංගන – බිබිල – 55%
මාහෝ - මාඑලිය - 53%
අම්පාර -උහන- 39%
කප්පල්තුරෙයි - 6 සැතපුම් කණුව - 21%
මොරවක - වරුකන්දෙණිය - 19%
මල්ලවපිටිය - රත්මල්ල්ගොඩ - 16.9%
විමලසුරේන්ද්‍ර- මස්කෙළිය -16.3%
කෑගල්ල- ගැවිලිපිටිය - 1.4%

7. ගැන්ට්‍රි ඉඩම් දහතුනෙන් 9ක් සඳහා 38A ගැසට් පත්‍රයක් නිකුත් කර ඇත. බිබිල සහ උහන ගැන්ට්‍රි ඉඩම් රජය සතු සහ නිරවුල් කර ඇත. වරුකන්දෙණිය ඉඩම ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තුමේන්තුවෙන් අනුමත වීමට නියමිතයි. රත්මල්ගොඩ ගැන්ට්‍රියේ සිවිල් වැඩ ආරම්භ කර ඇත.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | සැලසුම් සහ අධීක්ෂණ රාමුවේ තත්ත්වය<br>නිමැවුම් 2: කොන්ත්‍රාත්තුව 2019 මැයි මාසයේදී අත්සන් කරන ලද අතර ක්‍රියාත්මක කිරීම ප්‍රමාදයන් සහිතව සිදුවෙමින් පවතී. | | |
| (ඉ) | **පැකේජ 5** | | | | | | |
| | ලොට් 1:<br>ද්‍රව්‍ය සැපයීම සහ බෙදා හැරීම: තෙකලා බලශක්ති මීටර සහ මොඩම (25,000ක්) (Three phase energy meters and Modems) | 100 | 100 | 99.5 | 2020 වර්ෂයේ 4 කාර්තුව සඳහා සැලසුම් කර ඇති ව්‍යාපෘති ක්‍රියාකාරකම් අනුව, 2020 වර්ෂයේ 1 කාර්තුව අවසන් වන විට ලොට් 1 සඳහා ගෙවීම් අවසන් කළ යුතුය. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට වන විටත් ගෙවීම් පියවා නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.<br><br>සැලසුම් සහ අධීක්ෂණ රාමුවේ තත්ත්වය.<br><br>නිමවුම 2: උපකරණ ස්ථාපනය අවසන් කර නැත. | නිමවුම 1- ලොට් 1, මිල ගණන් කැඳවා ඇති හෙඩ්-එන්ඩ් පද්ධති පුහුණුව සඳහා ගෙවීම හැර අනෙකුත් සියලුම ගෙවීම් සිදු කරන ලදී. කොවිඩ් වසංගතය හේතුවෙන් මෙය ප්‍රමාද විය.<br><br>නිමවුම 2- ලොට් 1 සහ 4 හි උපකරණ සවි කිරීම පළාත් විසින් සිදු කරන ලදි, ට්‍රාන්ස්ෆෝමර් සඳහා නව මීටර් සවිකිරීමේ කටයුතු එක් එක් පළාත විසින් ඔවුන්ගේ ශ්‍රම ධාරිතාවයෙන් සිදු කරනු ලැබේ. | ඉතිරි වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |
| | ලොට් 4 :<br>ද්‍රව්‍ය සැපයීම සහ බෙදා හැරීම: වානේ මීටර බහලුම් (25,000ක්) Steel Meter Enclosures | 100 | 100 | 92.5 | | | |
| | ලොට් 5-<br>ද්‍රව්‍ය සැපයීම සහ බෙදා හැරීම: ABC 33 kV සහ උපාංග (80.1km), Surge arrestor සහ Switch cutout (1200 බැගින්) | 100 | 100 | 96 | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (ඊ) | **පැකේජ 6**<br>නාගදීපය, ඩෙල්ෆ්ට් සහ අනලිතිව් දූපත් 03හි දෙමුහුන් බලශක්ති පද්ධති ඉදිකිරීම | 100 | - | - | නාගදීපයේ පර්චස් 450.28 ක ඉඩම 2020 ජූලි 21 දින මිලදී ගෙන ඇත. 2021 දෙසැම්බර් 31 වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 වන විටත් ඩෙල්ෆ්ට් සහ අනලිතිව් හි ඉඩම සඳහා ඉඩම් වෙන් කිරීමේ ක්‍රියා පටිපාටිය අවසන් කර නොතිබුණි.<br><br>නිමවුම 1: කුඩා දූපත් තුනක ස්ථාපිත කිරීමට නියමිත කිලෝවොට් පැය 900 ක ගබඩා ධාරිතාවක් සහිත මෙගාවොට් 2.27ක දෙමුහුන් කුඩා ජාල පද්ධති මේවන විට ප්‍රදානය කර නොමැත. | කැබිනට් මණ්ඩලය මෙම විශේෂ ටෙන්ඩරය අවලංගු කර ඇත. | ප්‍රදාන නියෝජිතායතන සමඟ ගිවිසුම්වලට එළඹීමට පෙර ව්‍යාපෘති ක්‍රියාකාරකම් නිසියාකාරව සැලසුම් කළ යුතුය. |
| (උ) | **පැකේජ 7** | | | | | | |
| | ලොට් ඒ1:<br>පන්නිපිටිය කොටුමා උපපොළෙහි 100 MVAr BSC ස්ථාපනය කිරීම | 100 | 82 | 77 | සැලකිය යුතු ප්‍රමාදයන් හේතුවෙන්, සමස්ත ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කළ හැක. | කොවිඩ්-19 වසංගතය, කොවිඩ්-19 ගෝලීය බලපෑම හේතුවෙන් ද්‍රව්‍ය බෙදා හැරීමේ ප්‍රමාදය සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය වැනි විවිධ හේතූන් මත කොන්ත්‍රාත් පැකේජ 7 ලොට් ඒ1 ප්‍රමාද විය. | ප්‍රමාදයන් ආවරණය ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර අමතර වියදම් මඟහරවා ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවේ වැඩ නියමිත වේලාවට අවසන් කිරීමට සහතික විය යුතුය. |
| | ලොට් ඒ2:<br>බියගම කොටුමා උපපොළෙහි ස්ථිතික වර් පද්ධති (Static Var Systems) (SVS) | 100 | 48 | 30 | | | |

| | | | |
|---|---|---|---|
| ස්ථාපනය කිරීම | | | |
| ලොට් ඒ3: කොළඹ නගරයේ කොටුමා උපපොළෙහි 124Mvar බ්‍රේකර් ස්විච් කැපාසිටර් බැන්ක්ස් (Breaker Switched Capacitor Banks) ස්ථාපනය කිරීම සහ තුල්හිරිය කොටුමා උපපොළෙහි කැපාසිටර් බැන්ක්ස් (Capacitor Banks) ප්‍රතිස්ථාපනය කිරීම. | 100 | සපයා නොමැත | සපයා නොමැත |

**3.2 ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ නිම කිරීමේ ප්‍රමාදයන්**

| අංකය | ක්‍රියාකාරකම් | ආරම්භ කිරීමට/ ක්‍රියාත්මක කිරීමට/ නිම කිරීමට නියමිත දිනය | ආරම්භ කළ/ ක්‍රියාත්මක කළ/ නිම කළ දිනය | ප්‍රමාදය | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| (අ) | අනලතිව්, ඩෙල්ෆ්ට්ස් සහ නයිනතිව් යන කුඩා දූපත් තුනක හයිබ්‍රිඩ් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපිත කිරීම | කොන්ත්‍රාත්තුව 2016 වර්ෂයේ 3 වන කාර්තුව වන විට ප්‍රදානය කළ යුතු අතර කොන්ත්‍රාත්තුවේ කටයුතු 2017 වර්ෂයේ 4 වන කාර්තුව වන විට ආරම්භ කිරීමට නියමිතව තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට නයිනතිව් දූපතේ ඉඩම පමණක් මිලදී ගෙන තිබුණි. | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, ප්‍රදානය කිරීමට නියමිත දින සිට වසර 5 ½ කට වැඩි කාලයක් සහ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට නියමිත දින සිට වසර 4 ¼ කට වඩා වැඩි කාලයක් වේ. | කැබිනට් මණ්ඩලය මෙම විශේෂිත ටෙන්ඩරය අවලංගු කර ඇත. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිසි ලෙස සැලසුම් කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ආ) | මධ්‍යම වෝල්ටීයතා ජාලයේ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, ඇස්තමේන්තුගත වටිනාකමකම එජඩො මිලියන 34.99ක් වන කිලෝමීටර් 270.5ක් දිග කිලෝවොට් 33 රැහැන් මාර්ග සහ කිලෝවොට් 33 ගැන්ට්‍රි 13ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2016 තුන්වන කාර්තුව වන විට ප්‍රදානය කිරීමට අවශ්‍ය අතර කොන්ත්‍රාත්තුව කටයුතු 2017 වර්ෂයේ 4 වන කාර්තුව වන විට ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. | කොන්ත්‍රාත්තුව 2019 මැයි 30 දින එජඩො මිලියන 40.5ක පිරිවැයකට ප්‍රදානය කරන ලද අතර මෙම කොන්ත්‍රාත්තුවේ බලපැවැත්වෙන දිනය 2019 ජූලි 06 දින විය. මෙම පැකේජය යටතේ ගැන්ට්‍රි ඉදිකිරීම් සඳහා අත්පත් කර ගැනීමට ඉඩම් කට්ටි 13ක් මැනුම් කර ඇත. | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව පැකේජය 4 හි ප්‍රදානය කිරීමට නියමිත දින සහ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට නියමිත දින සිට වර්ෂ 2 ½ කට වැඩි කාලයක් වේ. | ගැන්ට්‍රි ඉඩම් දහතුනෙන් 9ක් සඳහා 38A ගැසට් පත්‍රයක් නිකුත් කර ඇත. බිබිල සහ උහන ගැන්ට්‍රි ඉඩම් රජය සතු සහ නිරවුල් කර ඇත. වරුකන්දෙණිය ඉඩම දිගුකාලීන බදු දීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට නියමිතය. රත්මල්ගොඩ ගැන්ට්‍රියේ සිවිල් ඉදිකිරීම් කටයුතු ආරම්භ විය. රැහැන් මාර්ග 11 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ විය. කුළුණු 1,211 න් අත්තිවාරම් 204 ක් පමණක් නිම කර ඇති අතර කුළුණු ස්ථාන 59 ක අත්තිවාරම් ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතී. රට තුළ පැතිර ගිය කෝවිඩ් වසංගතය, අයහපත් කාලගුණික තත්ත්වය, ඉන්ධන අර්බුදය සහ මිල ඉහළ යාම හේතුවෙන් කොන්ත්‍රාත්කරුගේ ක්‍රියාකාරිත්වය සැලකිය | කටයුතු කඩිනම් කළ යුතු අතර කොන්ත්‍රාත්කරුවන් ගේ වැඩ සමීපව අධීක්ෂණය කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | යුතු ලෙස අඩු මට්ටමක පැවතුනි. ඒ හේතුවෙන් අපේක්ෂිත ව්‍යාපෘති ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය. | |
| | | **පැකේජ 5 ලොට් 4 :** | | | | |
| | | ද්‍රව්‍ය සැපයීම සහ බෙදා හැරීම: වානේ මීටර් බහාලුම් (25,000ක්) 2016 3 වන කාර්තුව වන විට ප්‍රදානය කිරීමට අවශ්‍ය වූ අතර කොන්ත්‍රාත්තුවේ ක්‍රියාකාරකම් 2017 4 වන කාර්තුවෙ ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. | කොන්ත්‍රාත්තුව නැවත ලංසු කැඳවා 2019 අගෝස්තු 22 පිරිනමා ඇත. ක්‍රියාකාරකම් 2019 ඔක්තෝබර් 08 දින ආරම්භ කර ඇත. | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, ප්‍රදානය කිරීමට නියමිත දින සිට වර්ෂ 5කට වැඩි කාලයක් සහ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට නියමිත දින සිට වර්ෂ 4කට වැඩි කාලයක් වේ. | මුලින්ම ටෙන්ඩරය 2017 ඔක්තෝම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද අතර පසුව 2018 දෙසැම්බර් මාසයේදී නැවත ටෙන්ඩර් කරන ලදි. 2020 දී භාණ්ඩ ලබා දෙන ලදි. | කටයුතු කඩිනම් කළ යුතු අතර කොන්ත්‍රාත්කරුවන් ගේ කටයුතු සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| (ඇ) | සම්ප්‍රේෂණ පද්ධතියේ ප්‍රතික්‍රියාශීලී බල කළමනාකරණය වැඩිදියුණු කිරීම | මෙම පැකේජය සඳහා එජඩො 20.43 කට සමාන රු. මිලියන 2,941.92ක් වෙන් කර තිබුණි. කොන්ත්‍රාත්තුව 2017 1 වන කාර්තුව ප්‍රදානය කිරීමට අවශ්‍ය වූ අතර ක්‍රියාකාරකම් 2018 2 වන කාර්තුව වන විට ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. | | | | |

| | | | | |
|---|---|---|---|---|
| **ලොට් 1:** පන්නිපිටිය කොටුමා උපපොළෙහි 100 MVAr බේකර් ස්විච් කැපාසිටර් (Breaker Switched Capacitor) ස්ථාපනය කිරීම | කොන්ත්‍රාත්තුව ඇස්තමේන්තුගත පිරිවැය එජඩො මිලියන 1.5ක් යූරෝ මිලියන 3.76ක් රු.මිලියන 166.05කට 2019 මැයි 9 වන දින ප්‍රදානය කර ඇත. කොන්ත්‍රාත්තුවේ කටයුතු 2019 අගෝස්තු 01 දින ආරම්භ කර ඇත. | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, ප්‍රදානය කිරීමට නියමිත දින සිට වර්ෂ 2 ½ කට වඩා වැඩි කාලයක් සහ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට නියමිත දින සිට වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් වේ. | පිළිතුරු ලබාදී නොමැත. | කටයුතු කඩිනම් කළ යුතු අතර කොන්ත්‍රාත්කරුවන් ගේ කටයුතු සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| **ලොට් 2:** බියගම කොටුමා උපපොළෙහි ස්ථිතික වර් පද්ධති (Static Var Systems) (SVS). | කොන්ත්‍රාත්තුව 2020 මැයි 28 දින ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත්තුවේ කටයුතු 2020 ඔක්තෝබර් 08 දින ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට නියමිත දිනට වඩා වර්ෂ 1 ½ කට වැඩි කාලයක් සහ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට නියමිත දින සිට වර්ෂයකට වැඩි කාලයක් වේ. | පිළිතුරු ලබාදී නොමැත. | කටයුතු කඩිනම් කළ යුතු අතර කොන්ත්‍රාත්කරුවන් ගේ කටයුතු සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| **ලොට් 3:** කොළඹ නගරයේ කොටුමා උපපොළෙහි 124 MVAr බේකර් ස්විච් කැපාසිටර් බැන්ක්ස් (Breaker Switched Capacitor Banks) ස්ථාපනය සහ තුල්හිරිය කොටුමා උපපොළෙහි දෙටුන්ඩ් බේකර් ස්විච් කැපාසිටර් බැන්ක්ස් (detuned Breaker Switched Capacitor Bank) ප්‍රතිස්ථාපනය කිරීම (ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි නොමැති) | 2021 දෙසැම්බර් 31 දින වන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. | ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘතියට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට නොහැකි වනු ඇත. | පිළිතුරු ලබාදී නොමැත. | තවදුරටත් ප්‍රමාද කිරීමකින් තොරව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 නොවිසඳී පවතින පෙර විගණන වාර්තාවලින් පෙන්වා දී ඇති ගැටලු**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කර ඇති තොග ශේෂයන් පළාත් ගබඩාවල හඳුනාගත නොහැකි විය. | පිළිතුරු සපයා නොමැත | ව්‍යාපෘතියෙන් ලැබෙන තොග සම්බන්ධයෙන් පළාත් ගබඩාවල නිසි තොග පාලනයක් අනුගමනය කළ යුතුය. |
| (ආ) | ණයහිමියාගේ දිගුකාලීන හිඟ ශේෂයන් | පෙර විගණන වාර්තාවේ පෙන්වා දුන් දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කරන ලදි. (පැකේජය 1 ලොට් 1 සහ පැකේජය 2 ලොට් 3) | ණයහිමියන් සම්බන්ධ ගැටලුව විසඳීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය ආරම්භයේ සිටම මිලදී ගත් වාහන සඳහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවෙන් සභාපතිවරුන් සහ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා ඉල්ලා සිටි වාහන ප්‍රසම්පාදන අනුමැතියේ පිටපත් ලැබී නොතිබුණි. | ව්‍යාපෘති කටයුතු සඳහා ලං.වි.ම වාහන වෙන් කිරීමට වාහන නොතිබූ බැවින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ස්ථාපිත කමිටුවක අනුමැතිය ලබාගෙන ව්‍යාපෘති විෂය පථය යටතේ වාහන කිහිපයක් සපයා ගෙන ඇත. | නිසි අනුමැතිය ලබා ගත යුතුය. |

**3.4 ඉඩම් අත්පත් කරගැනීම පිළිබඳ ගැටලු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ගැන්ට්‍රීස් ඉදිකිරීම සඳහා රජයේ ඉඩම් සහ ලංකා විදුලිබල මණ්ඩලයේ ඉඩම් ඇතුළුව අත්පත් කර ගැනීමට අපේක්ෂිත ඉඩම් කට්ටි 14කින් 2021 දෙසැම්බර් 31 දින වන විට කිසිදු ඉඩමක් අත්පත් කර ගෙන නොතිබුණි. | 38A වගන්තිය ගැසට් පත්‍රය යටතේ ඉඩම් ලං.වි.ම ට පවරා ඇත. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |